


H.M. තිනාරා යෙනුලි සියන්සා

# නෙළුම් මලී සහ රෝස මලී

H.M. තිනාරා යෙනුලි සියන්සා
කතෘ

## කතෘගේ වෙනත් කෘති

මාළු අම්මයි මාළු පුතයි
චූටි බබා දැන් සතුටින්
රෝස මලක් කතා කරයි

## පාසල

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

## ඉගෙනුම ලබන පංතිය

5 - E

## කෘතිය පළ කරන දිනය

2026.05.10

## ISBN අංකය

978-624-208-943-0

# පිදුම

**මාගේ ආදරණීය**

**මහාමායා බාලිකා මාතාවට**

**මා විසින් නිම කළ**

**මෙම කථා පුවත**

**ආදරයෙන්**

**පුදමි.**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවිඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි. අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ථ සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සර් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවිඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව.<br>
**2026.05.10**

# නෙලුම් මලී සහ රෝස මලී

ලස්සන සුරංගනා ලෝකෙක සුරංගනාවියෝ ජීවත් වුණා. ඒ අතර නෙලුම් මලී සහ රෝස මලී කියලා සුරංගනාවියෝ දෙදෙනෙක් සිටියා. මේ දෙන්නා හරිම ලස්සනයි. සුරංගනා ලෝකයේ හැමෝම මේ දෙන්නට ආදරෙයි. හැබැයි රෝස මලී හරිම හොඳ කෙනෙක්. නෙලුම් මලී නම් ටිකක් නපුරුයි.

රෝස මලීගේ හොඳ ගතිගුණ නිසා දවසින් දවස රෝස මලී ලස්සන වුණා. රෝස මලී නිතර අනුන්ගේ දුකට පිහිට වෙන කෙනෙක්.

නෙළුම් මලී තමන්ගේ ලස්සන නිසා ආඩම්බර වුණා. එයා අනිත් අයගේ දුකට පිහිට වුණෙත් නැහැ. ඒ නිසා එයාගේ ලස්සන දවසින් දවස අඩු වුණා.

නෙලුම් මලී රෝස මලීත් සමඟ ගොඩක් තරහෙන් හිටියේ. එක දවසක් රෝස මලී සුරංගනා ලෝකේ කුරුලු පැටවුන්, සමනල් පැටවුන් එක්ක ගීත ගයමින් විනෝදයෙන් හිටියා. මේ අය රෝස මලීට ගොඩක් ආදරෙයි.



මේ දෙස බලා සිටි නෙලුම් මලී සිතුවා මේකට කුමක් හෝ කරන්න ඕන කියලා. නෙලුම් මලී තව තවත් කල්පනා කළා. නෙලුම් මලීට හොඳ අදහසක් ආවා. රෝස මලීව කොහොම හරි සුරංගනා ලෝකෙන් එළවා දමන්න සිතුවා. එතකොට එයාට හැමෝම ආදරේ කරයි කියලා නෙලුම් මලී සිතුවා.



දවසක් දා නෙළුම් මලී රෝස මලීගෙන් මෙහෙම අහුවා. අපි දෙන්නා මිනිස් ලෝකෙට යමුද කියලා. රෝස මලී එකපාරටම හා කිව්වා. දැන් මේ දෙන්නා මිනිස්සු ඉන්න ලෝකෙට ගියා.



මේ දෙන්නා හැම තැනම ඇවිද්දා. නෙලුම් මලී රෝස මලීව කොහොම හරි අතරමං කරන්න සිතුවා.

කැළෑවක ඇවිදගෙන ගිය මේ දෙන්නාට හොඳට ම මහන්සියි. දැන් රෑත් වෙලා නෙලුම් මලී රෝස මලීව බියකරු ගුහාවක අතරමං කළා.



ඊට පස්සේ දුවගෙන ගියා. නෙලුම් මලී උගුලකට අසුවුණා. රෝස මලී හොඳටම අඬනවා. ගුහාව ඇතුලේ හරිම කලුවරයි. රෝස මලීට හොඳටම බය හිතුණා.

නෙලුම් මලීගේ කකුල හොඳටම තුවාල වෙලා. නෙලුම් මලී කෑ ගසනවා. රෝස මලීට කවුදෝ කතා කරන ශබ්දයක් ඇසුණා.



හොඳට කන් දුන්නු රෝස මලීට පුංචි සමනල් පැටියෙක්ගේ උදව් ලැබුණා ගුහාවෙන් එළියට එන්න. රෝස මලීගේ බය නැති වුණා. ඔහොම යනකොට නෙලුම් මලී වේදනාවෙන් කෑ ගසන ශබ්දය රෝස මලීට ඇසුණා. රෝස මලී වටපිට බැලුවා. නෙලුම් මලී කකුල අල්ලගෙන කෑ ගසනවා. හොඳටම ලේත් එනවා.



රෝස මලී ඉක්මනට නෙළුම් මලී අර උගුලෙන් බේරා ගත්තා. නෙළුම් මලීට හොඳටම දුක හිතුණා. රෝස මලීව බදාගෙන ඇඬුවා.

නෙළුම් මලී සිදු වූ සේරම රෝස මලීට කිව්වා. එයාගෙන් සමාව ගත්තා.

එදා ඉඳලා නෙළුම් මලී රෝස මලීට හා අනිත් අයට කරදර කළෙත් නැහැ.

හැමවෙලේම හැමෝට ම උදව් කළා.



රෝස මලී තරම් නෙලුම් මලී
තවත් ලස්සන වුණා.

සුරංගනා ලෝකේ මේ දෙන්නා
සතුටින් ජීවත් වුණා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)